**මිහින්තලය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 20 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුර නැඟුම ව්‍යාපෘතියෙන් දරා තිබුණු රු. 9,776,553 ක වියදම් සභාවේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභා අරමුදලින් ලබාදුන් රු. 1,609,744 ක සේවක ණය, වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සභාව විසින් නඩත්තු කරන මුදල් පොත් 03 ක් අතර සිදුකර තිබුණු රු.2,142,429 ක මුදල් හුවමාරුකිරීම්, වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 732,378 ක් වූ තැන්පතු ආපසු ගෙවීම් සහ අත්තිකාරම් ගෙවීම් වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) වැය විෂයයන් 05 කට අදාලව හඳුනාගත නොහැකි රු. 1,469,025 ක වියදම් ආදායම් වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පුස්තකාලය සහ රැස්වීම් ශාලාව ඉදිකිරීමට 2012 වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.251,573 ක පොලිය ආදායම් වියදම් ගිණුමේ රු.451,325 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම් රු.199,752 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ණය ආපසු ගෙවීම් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.2,602,992 ක ණය ශේෂ රු.2,351,417 ක් ලෙස දැක්වීම හේතුවෙන් ණය ප්‍රාග්ධනය රු.251,575 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනයේ රු.20,000,000 ක් ලෙස දක්වා තිබුණු පෙර පාසැල් ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම රු. 18,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) මිහින්තලේ සතිපොළ ගොඩනැගිල්ල වෙනුවෙන් වැයකර තිබූ රු.28,226,038 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.1,200,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම් ගිණුම රු. 27,026,038 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) කඩකාමර 102 කට අදාල සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම රු. 2,644,800 ක් වුවත් ගිණුම්වල රු.2,731,799 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 86,999 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සභාව සතු දේපල 04 ක් බදුදීම වෙනුවෙන් වාර්ෂිකව ලැබිය යුතු රු.920,700 ක කුලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,136,411 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 215,711 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ඉහත (ඔ) ඡේදයේ දක්වා ඇති රු.920,700 ක ආදායම මූල්‍ය ප්‍රකාශනයේ 5-23 ආදායම් විෂය යටතේ ගලපා තිබියදී නැවත ආදායමක් ලෙස 5 – 24 ආදායම් විෂය යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) හඳුනාගෙන නොමැතිව ආදායමට බැරකර තිබුණු රු.807,056 ක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලබාදී තිබුණු එකතුව රු.856,200 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ච) 2017 වර්ෂයට අදාල එකතුව රු.139,859 ක් වූ උපචිත වියදම් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් බැරකම් හා වියදම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) එකතුව රු. 814,294 ක් වූ ස්ථාවර වත්කම් විවිධ අවස්ථාවලදී භාවිතයෙන් ඉවත් කර තිබුණද අදාල වත්කම් උපලේඛනයෙන් ඉවත් නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ට) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 1,121,265 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.6,970,643 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.5,849,378 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව නඩත්තු කරන ප්‍රා.ස 04 වාර්තාවෙහි දැක්වෙන ආදායම් හා මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ආදායම් අතර රු. 1,837,800 ක වෙනසක් පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලිය රු.225,775 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.622,645 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.396,870 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

වර්ෂ 05 කට වැඩි කාලයක් සිට පැවත එන වටිනාකම රු. 1,668,839 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක් හා වටිනාකම රු.2,730,468 ක් ගෙවිය යුතු ගිණුම් ශේෂ 13 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.283,809 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත වගන්තිය 177 | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | මෝටර් ප්‍රවාහන පනත 203 අධිකාරිය 2(1) වගන්තිය | සභාව සතු ටැෆේ ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක්, අත් ට්‍රැක්ටරයක් සහ ජල බවුසර් 02 ක් ලියාපදිංචි කර නොතිබුණි . |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව භාවිතා කරන පරිගණක හා මෘදුකාංග පිළිබඳ වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක 09 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛය | සභා බල ප්‍රදේශයේ පිහිටි වපසරිය අක්කර 120 ක් වූ සුසාන භූමි 45 ක් සුසාන භූමි හා භූමිදාන ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රකාශයට පත්කර නොතිබුණි. එමෙන්ම ඒවාගේ ආරක්ෂාව සඳහා මායිම් වැටවල් යොදා නොතිබුණු අතර ඇතැම් භූමිවල අයිතිය පවරා ගෙන නොතිබුණි. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.9.1 | සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ එක් සමාජිකයෙකු කිසිදු ප්‍රසම්පාදන රැස්වීමකට සහභාගී වී නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායමට වඩා වැඩි වූ වියදම රු.6,618,435 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,056,159 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | වර්ෂයේ බිල්කල 2017 ආදායම | 2017 රැස්කළ ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017.01.01 හිඟය<br>වටිනාකම | බිල්කළ 2017 මුදලින්<br>වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| කඩ කාමර කුලී | 140,605 | 2,644,800 | 2,566,250 | 2,425,645 | 219,155 |
| ටෙන්ඩර් ගාස්තු | 920,700 | 920,700 | - | 923,849 | - |
| කසල ඉවත් කිරීමේ ගාස්තු | - | 551,232 | - | 594,054 | - |
| සතිපොල | - | 1,500,000 | - | 1,673,660 | - |
| එකතුව | 1,061,305 | 5,616,732 | 2,566,250 | 5,617,208 | 219,155 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ සංවර්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කර , දේපල වල වාර්ෂික තක්සේරුවක් සිදුකර වරිපනම් අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණ, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභා බල ප්‍රදේශයේ රැස්වන ඝන හා මළ අපද්‍රව්‍ය කිසිදු ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියකට භාජනය කිරීමකින් තොරව ප්‍රදේශයේ රක්ෂිත භූමියකට මුදාහැර තිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

------------------

සභා බල ප්‍රදේශයේ රැස්වන ඝන හා මළ අපද්‍රව්‍ය ස්වභාවික පරිසරයට මුදාහැර වල දැමීම හා ගිනි තැබීම හේතුවෙන් විශාල පාරිසරික හා වායු දූෂණයක් සිදුවන බව හා ඒවා ආහාරයට ගන්නා සතුන්ගේ සෞඛ්‍යටද තර්ජනයක් වන බව නිරීක්ෂණය විය.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳ සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ශේෂ 06 කට අදාල එකතුව රු. 1,410,017 ක් වූ ශේෂ සනාථ කිරීමට අවශ්‍ය තොරතුරු වර්ෂ ගණනාවක සිට සභාව සතුව නොතිබුණු අතර එකී ශේෂවල නිවැරදිතාවය තහවුරු කරගෙන අයකර ගැනීමට හෝ ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව වටිනාකම සඳහන් නොවූ භාණ්ඩ විෂයයන් 70 ක් අස්ථානගත වී තිබූණි.

(ඇ) 2004 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභා බල ප්‍රදේශයේ දේපල පැවරීම් වාර්තා පරික්ෂා කර සභාවට ලැබිය යුතු මුද්දර ආදායම් රු.6,108,263 ක් ලෙස ගණනය කර ගිණුම්ගත කර තිබූ නමුත් සභාවට ලැබිය යුතු ලෙස පළාත් ආදායම් කොමසාරිස් නිර්දේශ කර තිබූ මුදල රු.2,284,650 ක් විය. පළාත් ආදායම් කොමසාරිස්ගේ නිර්දේශය නොලැබූ රු.3,823,613 ක හිඟ මුද්දර ගාස්තු ප්‍රමාණය සොයා බලා අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) ලීටර් 1000 ජල ටැංකි 04 ක් භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව අබලි ද්‍රව්‍ය වශයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු භාවිතයට නොගන්නා ආවරණය සහිත ට්‍රේලරය , ඩබල් කැබ් රථයක් හා යතුරු පැදියක් දිරාපත් වීමට ඉඩහැර ගාල්කර තිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 31 ක බදුකරුවන් විසින් ගිවිසුම් කඩ කරමින් අතුරු බදු දී තිබුණ නමුත් ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ද විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කඩහිමියන් විසින් අනවසරයෙන් කඩ කාමර අළුත්වැඩියාවන් සහ නව ඉදිකිරීම් සිදුකර තිබුණි.

(ඇ) 2009 වර්ෂයෙන් පසු කඩ කාමර තක්සේරු කර නොතිබූ අතර ගිවිසුම් යාවත්කාලීන නොකළ කඩ කාමර ගණන 58 ක් විය.

(ඈ) කඩ කාමර 02 ක් බදු දීම සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

3.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු

------------------

සභාව සතු වාහන වල ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා නොගැනීම නිසා ගෙවීමට සිදුවී තිබූ දඩය රු.6,510 ක් විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිසි පුරෝකතනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 05 ක අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර සියයට 52 සිට සියයට 166 දක්වා වූ

පරාසයක විචලනයක් හා වියදම් විෂයන් 05 ක අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 55 සිට සියයට 4,733 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය විය.

(ආ) පොළී ගෙවීම් , ලාභාංශ හා ප්‍රසාද මුදල් වියදම් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා අයවැයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණද සමාලෝචිත වර්ෂය තුල රු. 2,065,890 ක වියදමක් දරා තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණු නමුත් අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

2009 ජුනි 09 දිනැති DMA 2009 (i) අංක දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා නොතිබුණි.

5 පද්ධති හා පාලනය

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | නිසි පරිදි හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ආ) | අභ්‍යන්තර පාලනය | (i) අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොකිරීම.<br>(ii) විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම. |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්රසම්පාදන සැලැස්ම සකස් නොකිරීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | (i) දේපල බදුදීමේදී ගිවිසුම් අත්සන් නොකිරීම.<br>(ii) දේපල නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඉ) | වාහන පාලනය | (i) වාහන ලියාපදිංචි නොකිරීම.<br>(ii) ආදායම් බලපත්‍ර ලබා නොගැනීම |
| (ඊ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකිරීම |